ඉතාලිය

MINISTERO DELL'INTERNO

euaa EUROPEAN UNION AGENCY FOR ASYLUM

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



- ඔබ වැඩිහිටියෙක් (වයස අවුරුදු 18 ට වැඩි) නම්
- ඉතාලිය හි ජාත්‍යන්තර ආරක්ෂාව ( රැකවරණය ලෙසද හැඳින්වේ) සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය බව ඔබ බලධාරීන්ට පැවසුවේ නම් සහ ඔබ දැන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු නම් මෙම තොරතුරු ඔබ සඳහායි.

**ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි.**

SINHALESE

## පිළිගැනීම යනු කුමක්ද?

බලධාරීන් ඔබේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර අයදුම්කරුවෙකු ලෙස ඔබට ලැබෙන සහාය පිළිගැනීම වේ. මෙම විස්තර පත්‍රිකාවේ පැහැදිලි කර ඇති පිළිගැනීමේ අයිතීන් සහ වගකීම් එයට ඇතුළත් වේ.

ඉතාලියේදී, අයදුම්කරුවන්භාරගැනීම සම්බන්ධයෙන් වගකිවයුතු ආයතනය වන්නේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයයි (විශේෂයෙන්ම සිවිල් නිදහස සහ ආගමන කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය පරිපාලන කාර්යාලය ; ඒ අතරම, ඔබගේ රැකවරණ අයදුම්පත (විමර්ශනය කිරීමට බලයලත් ආයතනය වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව පිළිගැනීම සඳහා වන ප්‍රාදේශීය කොමිසමයි.



මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු ඔබට ලැබුණු බව තහවුරු කර අත්සන් කරන ලෙස කාර්ය මණ්ඩලය ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. ඔබ ඔබේ අයදුම්පත ලියාපදිංචි කිරීමට පෙර ඔබට තවත් තොරතුරු ලැබෙනු ඇත.

අවශ්‍ය විටෙක, ඔබට වැටහෙන භාෂාවකින් *අධිකාරිය නියම වශයෙන් සඳහන් කළ යුතුද යන්න තීරණය කිරීමට* කාර්ය මණ්ඩලය සමඟ සන්නිවේදනය කිරීමට **පරිවර්තකයෙකු** ඔබට සහාය වනු ඇත. පරිවර්තකයා ඔබ පවසන කිසිවක් වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත.

**රැකවරණ ක්‍රියාපටිපාටිය සහ අනුගමනය කළ යුතු නීති පිළිබඳ ව තොරතුරු ඔබට වෙන් වෙන් විස්තර පත්‍රිකාවලින් සොයාගත හැකි වනු ඇත.**

ඔබට වෙනත් සංවිධානවලින් තොරතුරු සහ උපකාර නොමිලේ ඉල්ලා සිටිය හැකිය. මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ඔබට සංවිධාන ලැයිස්තුවක් සොයාගත හැකිය.

**ඔබ දැන් ඉතාලිය හි සිටින අතර, එය EU රටකි. EU+ රටවල් වන්නේ:**

- යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ
- අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## අවධානය පිණිසයි!

රැකවරණය සඳහා අයදුම් කිරීම සහ අනෙකුත් EU+ රටවලට ගමන් කිරීම සම්බන්ධව නීති පවතී.


බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, **ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි රැකවරණය සඳහා අයදුම් කර ඔබේ අයදුම්පත ලියාපදිංචි කළ යුතුය.**

**ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ එක් EU+ රටක් පමණි. ඉතාලිය** හි බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත සඳහා වගකිව යුතු EU රට තීරණය කිරීමට ක්‍රියාපටිපාටියක් අනුගමනය කරනු ඇත..

**ඔබ ඉතාලිය තුළ රැඳී සිටිය යුතුය. බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබට වෙනත් EU+ රටකට ගමන් කළ නොහැක.** ඔබ ඉවත් ව ගියහොත්, සෘණාත්මක ප්‍රතිවිපාක ඇති වනු ඇත. ඉතාලිය තුළ ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය. අනෙක් රට තුළ ඔබේ ගමන් කිරීමේ නිදහස සීමා විය හැකි අතර ඇතැම් පිළිගැනීමේ සේවා අවලංගු කෙරෙනු ඇත.

## ඔබට ලැබෙන්නේ මොනවාද?

[*මෙම වාක්‍යය ජාතික නීති සම්පාදනය සහ භාවිතය මත පදනම්ව අවශ්‍ය පරිදි වෙනස් කළ හැකිය.*] ඔබේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය මත පදනම්ව, ඔබට පහත දේ ලැබෙනු ඇත :



- නවාතැන්



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ආහාර



- ඇඳුම් පැළඳුම්





- දෛනික වියදම් සඳහා මුදල්

*සහ අවශ්‍ය පරිදි වෙනස් කළ හැකි*] ඔබේ පුද්ගලික සහ මූල්‍ය තත්ත්වය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා බලධාරීන් ඔබෙන් ප්‍රශ්න අසනු ඇත.

*සහ අවශ්‍ය පරිදි වෙනස් කළ හැකි*] බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයේ පමණක් ඔබට සහාය සහ සේවා ලැබෙනු ඇත.


## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය



ඔබට **අවශ්‍ය සෞඛ්‍ය සේවාව** ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත.

හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට ඔබට සිදු විය හැක ඔවුන් ඔබේ සෞඛ්‍යය පරීක්ෂා කර ඔබට සහාය වනු ඇත.

## කාර්ය මණ්ඩලයට දන්වන්න:



- ඔබ වයස අවුරුදු 18 ට අඩු නම් සහ ඔබ පැමිණියේ ඔබේ දෙමාපියන් නොමැතිව, තනිවම හෝ පවුලේ අනෙකුත් සාමාජිකයන් සමඟ නම්
- ඔබ අසනීප හෝ තුවාල ලබා සිටී නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම් ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට විශේෂිත සහාය අවශ්‍ය පවුලේ සාමාජිකයන් සිටී නම්
- ඔබට ආබාධයක් තිබේ නම්
- ඔබට නිරන්තරයෙන් දුකක්, කනස්සල්ලක් දැනෙනවා නම්, ඔබට නිදාගත නොහැකි නම් හෝ ඔබට සෘණාත්මක සිතුවිලි තිබේ නම්
- ඔබව අපයෝජනයට ලක් කර ඇත්නම්
- ඔබට අනාරක්ෂිත බවක් දැනී තිබේ නම් හෝ දැනෙනවා නම් හෝ ඔබ යමෙකුට බිය නම්
- ඔබට සහාය අවශ්‍ය වෙනත් ඕනෑම අවස්ථාවක සිටී නම්

**ඔබට කාර්ය මණ්ඩලය විශ්වාස කළ හැකි අතර ඔවුන්ට ඔබට සහාය වීමට හැකි වන පරිදි ඔවුන් සමඟ නිදහසේ කතා කළ හැකිය.** සියලුම තොරතුරු රහසිගතව තබා ගනු ඇත, එනම් ඔබේ එකඟතාවයකින් තොරව ඒවා අන් අය සමඟ බෙදා නොගනු ඇත.

එය එසේ නොවන්නේ ඔබේ හෝ වෙනත් කෙනෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇති අවස්ථාවක පමණි.

## ළමුන් සඳහා අධ්‍යාපනය ලැබීමේ අයිතිය

වයස අවුරුදු 18 ට අඩු සියලුම ළමුන්ට, පිරිමි ළමුන්ට සහ ගැහැණු ළමුන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත..




## රැකියාවක නිරත වීමට සහ පාඨමාලා හැදෑරීමට ඇති අයිතිය

ඔබේ තත්ත්වය අනුව, යම් යම් කොන්දේසි යටතේ ඉතාලිය හි රැකියාවක නිරත වීමට ඔබට අයිතියක් තිබිය හැකිය. ඔබට රැකියාවක නිරත වීමට ඇති අයිතිය පවතින්නේ කුමන කොන්දේසි යටතේ ද යන්න කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.

ඔබට හැදෑරිය හැකි පාඨමාලා මොනවාද යන්න පිළිබඳව ද ඔවුන් ඔබට පවසනු ඇත.







## ඔබ නැවතී සිටින්නේ කොහේද?

බලධාරීන් ඔබ නැවතී සිටින ස්ථානය ඔබට පවසනු ඇති අතර කොන්දේසි පැහැදිලි කරනු ඇත.

ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ නැවතී සිටින ස්ථානය බොහෙෝ සාධක මත රඳා පවතී.



## අවධානය පිණිසයි!

බලධාරීන් **ඔබ නිශ්චිත ස්ථානයක** (උදාහරණයක් ලෙස නිශ්චිත පිළිගැනීමේ මධ්‍යස්ථානයක) **නැවතී සිටිය යුතු බව** තීරණය කළ හැකිය.

යම් යම් සීමාවන් සහිතව ඔබට එම නිශ්චිත ස්ථානයෙන් පිටතට යාමට නිදහස තිබේ. එම නිශ්චිත ස්ථානයේ ඔබේ පැමිණීම නිතිපතා පරීක්ෂා කරනු ඇත.



**ඔබ කොතැනක නැවතී සිටියත්, ඔබට පහත අයිතීන් ඇත:**



- **සුරක්ෂිත වන්න:** කාර්ය මණ්ඩලය ඇතුළු කිසිවෙකුට ඔබට තර්ජනය කිරීමට, අපහාස කිරීමට හෙෝ හානි කිරීමට අවසර නැත.



- **ඔබේ සැමියා, බිරිඳ, දරුවන් සහ වයස අවුරුදු 18 ට අඩු සහෙෝදර සහෙෝදරියන් සමඟ හෙෝ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටි ඥාතියෙකු සමඟ නැවතී සිටින්න.**
- ඔබ දෛනික රැකවරණය අවශ්‍ය වැඩිහිටියෙකු නම්**, ඔබේ ඥාතීන් සමඟ නැවතී සිටින්න.**



- ඔබේ පවුලේ අය සමඟ සන්නිවේදනය කිරීමට සහ ඔවුන් සිටින ස්ථානය ඔබ නොදන්නේ නම්, ඔවුන් සොයා ගැනීමට උපකාර ලබා ගන්න.

## අයදුම්කරුවෙකු රඳවා තබා ගත හැකි අවස්ථා

රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ ඔබට නිදහසේ පිටව යා නොහැකි නිශ්චිත පහසු ස්ථානයක ඔබව තබා ඇති බවයි. ඔබව රඳවා තබා ගැනීමට බලධාරීන්ට වලංගු හේතුවක් තිබිය යුතුය. ඔබේ තත්ත්වයේ දී වෙනත් විකල්පයක් කළ නොහැකි බවට ඔවුන් සහතික විය යුතුය. බලධාරීන් තීරණය කිරීමට පෙර ඔබේ පුද්ගලික තත්ත්වය පිළිබඳව සලකා බලනු ඇත.



රඳවා තබා ගැනීමට හේතු විය හැක්කේ, උදාහරණයක් ලෙස:

- රඳවා තබා ගැනීමකින් තොරව ඔබේ රැකවරණ අයදුම්පතෙහි වැදගත් අංග (උදාහරණයක් ලෙස ඔබේ අනන්‍යතාවය) සත්‍යාපනය කළ නොහැකිය
- ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටීමේ වගකීමට ගරු නොකළ අතර, ඔබ නැවත පලා යාමේ අවදානමක් ඇත, එමෙන්ම බලධාරීන්ට ඔබ වෙත ළඟා විය නොහැකිය
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU + රටට මාරු කිරීමට ඔබට තීරණයක් ලැබී ඇති අතර මාරුවීමට පෙර ඔබ පලා යාමේ අවදානමක් ඇත
- ඔබ ආරක්ෂක අවදානමක් ඇති බව පෙන්වයි

ඔබව රඳවා තබාගෙන සිටී නම්, ඔබට තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. ඔබට නොමිලේ නීති සහාය සහ නියෙෝජනය ඉල්ලා සිටිය හැකිය.



## මෙම අදියරේදී ඔබේ පිළිගැනීමේ වගකීම් මොනවාද?

**ඔබ ඉටු කළ යුතු වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.**

- ✓ මේ රටේ නීති පිළිපදින්න.
- ✓ ඉතාලිය තුළ නැවතී සිටින්න සහ බලධාරීන්ගේ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් නොකරන්න.
- ✗ බලධාරීන් නැවතී සිටිය යුතු යැයි පැවසු ස්ථානයෙන් අවසරයකින් තොරව පිටව නොයන්න.
- ✓ ඔබ නැවතී සිටින ස්ථානයේ නීතිවලට ගරු කරන්න.
- ✓ ඔබේ සම්බන්ධතා තොරතුරු පිළිබඳව බලධාරීන්ට දැනුම් දෙන්න.



## ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?

බලධාරීන් ඔබේ තත්වය ඇගයීමට ලක් කර ඔවුන් ගනු ඇති ඕනෑම පියවරක් පිළිබඳව ඔබට දැනුම් දෙනු ඇත.


උදාහරණයක් ලෙස, ඔබ නැවතී සිටිය යුතු බවට බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයෙන් අවසරයකින් තොරව පිටව ගියහොත් හෝ ඔබ දැනටමත් වෙනත් EU+ රටක රැකවරණය සඳහා ඉල්ලුම් කර එතැනින් පිටව ගියහොත් **ඔබට අඩු සහයෝගයක් ලැබිය හැකිය.**

ඔබ ප්‍රචණ්ඩකාරී නම්, අන් අයට තර්ජනය කරන්නේ නම් හෝ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති නැවත නැවතත් හෝ බරපතල ලෙස කඩ කරන්නේ නම් **ඔබට ලැබෙන සහයෝගය අහිමි විය හැකිය.**





## බලධාරීන්ගේ අවසරයකින් තොරව ඔබ වෙනත් EU+ රටකට ගමන් කළහොත් කුමක් සිදුවේද?




**ඉතාලියෙහි :**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**ඔබ අවසරයකින් තොරව ගමන් කළ EU+ රටෙහි:**

- ඔබ අවසරයකින් තොරව හැර ගිය රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් ඔබව ආපසු යැවීමේ තීරණය පිළිබඳව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට **ඇතැම් ආකාරයේ සහායන්** නොලැබෙනු ඇත
- ඔබට **රැකියාවක නිරත වීමට හෙෝ පාඨමාලා හැදෑරීමට අවසර නොලැබෙනු ඇත.**

## ඔබට අධිකාරියේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර ඔබට නීතිමය සහාය ද ලබා ගත හැකිය

අයදුම්කරුවෙකු ලෙස ඔබේ අයිතීන් සීමා කිරීමට බලධාරීන් තීරණය කරන්නේ නම් සහ එය අසාධාරණ යැයි ඔබ විශ්වාස කරන්නේ නම්, **ඔබට එම තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.**

ඔබේ තත්ත්වය මත පදනම්ව, ඔබට නොමිලේ නීතිමය සහාය සහ නියෙෝජනය ලබා ගත හැකිය. මෙයින් අදහස් වන්නේ නීති උපදේශකයෙකු හෙෝ නීතිඥයෙකු [සාමාජික රටට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට] ඔබට උපකාර කරනු ඇති බවයි.

ඔබට සැමවිටම බලධාරීන්ගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් හෙෝ UNHCR වෙතින් නොමිලේ නීතිමය සහාය සහ නියෙෝජනය ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා ඉල්ලා සිටිය හැකිය.

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025